සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 33 S I

නම: ..........................................

ඉතිහාසය

කාලය : පැය එකයි

සැලකිය යුතුයි,

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමිය.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1),(2),(3),(4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයට මුල්තැන දෙමින් රචනා කරන ලද ග්‍රන්ථය මේ අතරින් කුමක් ද?
1. රසවාහිනිය. 2. රාජාවලිය. 3. දීපවංශය. 4. නිකාය සංග්‍රහය.

02. අපේ සංස්කෘතික ඉතිහාසය පෙන්නුම් කරන ජීව මාන සාක්ෂි ඇතුළත් පිළිතුර මින් කුමක් ද?
1. ආගමික විශ්වාස ඇදහිලි හා සිරිත් විරිත්. 2. සීගිරි චිත්‍ර ගල් කණු හා වැව්.
3. පැරණි චිත්‍ර මූර්ති හා කැටයම්. 4. සෙල්ලිපි හා ගෘහ නිර්මාණ චිත්‍ර.

03. පහත තොරතුරු අතරින් වෙනත් පුද්ගලයින් විසින් පවසන ලද තොරතුරු මත ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා ලියූ පුද්ගලයා වන්නේ,
1. රොබට් නොක්ස්. 2. රිබෙයිරෝ. 3. පර්නාඕ ක්වේරොස්. 4. පිලිප්පස් බැල්දියස්.

04. පුරා වස්තු ආරක්ෂා කිරීම කළ යුතු වන්නේ පහත සඳහන් කවර කරුණක් නිසා ද?
1. සංචාරක ව්‍යාපාරයට අවශ්‍ය වන නිසා ය.
2. ලාංකික අනන්‍යතාව පෙන්නුම් කිරීමට හේතුවන නිසා.
3. අතීත පාලකයන්ගේ වාරි තාක්ෂණය අවබෝධ කර ගැනීමට.
4. පැරණි වාස්තු විද්‍යාව දැන ගැනීම සඳහා.

05. උඩ මළල, අළුගල්ගේ, බුන්දල ප්‍රාග් ඓතිහාසික ජනාවාස අයත් වන පරිසර කලාපය වන්නේ,
1. පහත රට වියළි කලාපය. 2. පහත රට අතරමැදි වියළි කලාපය.
3. කඳුකර වියළි අතරමැදි කලාපය. 4. අර්ධ ශුෂ්ක කලාපය.

06. - කැලෑ දෙල් ඇට පුළුස්සා ආහාරයට ගැනීම.
- ආහාර සඳහා ලුණු භාවිතා කිරීම.
ඉහත සාක්ෂි හමු වූ ප්‍රාග් ඓතිහාසික ස්ථානය මින් කුමක් ද.
1. බෙල්ලන්බැඳි පැලැස්ස. 2. කිතුල්ගල බෙලිලෙන. 3. අත්තනගොඩ අළුලෙන. 4. බටදොඹ ලෙන.

07. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාප තීරණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබ ඇති ප්‍රධාන සාධකය වන්නේ,
1. ස්වාභාවික සම්පත් බහුල ප්‍රදේශ. 2. වාර්ෂික වර්ෂාපතන අගයන්.
3. ස්වාභාවික වෘක්ෂලතා කලාප. 4. දේශගුණය.

08. - යකඩ භාවිතය ආරම්භ වීම.
- ගිලා නොබසින ලෙස ගෙබිම සකස් කිරීම.
ඉහත සාක්ෂි හමුවන යුගය වන්නේ,
1. මුල් ඓතිහාසික යුගය. 2. ප්‍රාග් ඓතිහාසික යුගය.
3. පූර්ව ඓතිහාසික යුගය. 4. ඓතිහාසික යුගය

09. විනාශකාරී ගංවතුර පාලනය කිරීමේ තාක්ෂණය නොදත් මුල් ඓතිහාසික යුගයේ ජනතාව තම ජනවාස පිහිටුවා ගත්තේ,
1. ගංගාවේ පිටාර නිම්නයට දුරස්ථව ය. 2. කඳුකර ප්‍රදේශ වල ය.
3. ගංගාවේ පිටාර නිම්නයට ආසන්නව ය. 4. ගංගා නිම්නයට ඉහළ කොටසේ ය .

10. බ්‍රාහ්මී සෙල්ලිපි වල අවරණ ලෙස හඳුන්වා ඇත්තේ,

1. අමුණු. 2. ගංගාව. 3. ගම් වැව. 4. ඇල මාර්ග.

11. පහත I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ දැක්වෙන සාහිත්‍ය ග්‍රන්ථ අතර සම්බන්ධතාවයක් ඇත. I තීරුවේ අනුපිළිවෙළ අනුව II තීරුව නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව. | II තීරුව |
|---|---|
| 1. පැරණි ගමක දිළිඳු වැසියෙක් ගමිකගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගැනීම. | A - බුත්සරණ. |
| 2. ගමිකයන් ගෘහපතීන් අතරින්ම පත් වූ අයෙකු බව. | B - ධම්පියා අටඅවා ගැටපදය. |
| 3. සූප ශාස්ත්‍රයේ දක්ෂ කතුන් මධුපාචිකා ලෙස හැඳින් වීම. | C - ජාතකට්ඨ කථාව. |
| 4. අතීතයේ හේන් වගාව සෙහෙන් ලෙස දක්වා තිබීම. | D - සමන්තපාසාදිකා. |

1. ABCD 2. CDBA 3. ADBC 4. CDAB

12. රාජ්‍යත්වය පිළිබඳ ව්‍යවහාර වූ සෑම සංකල්පයකින් ම රජුගේ උසස් බව හැඟවීමට උත්සහා දරා ඇත. ඒ තුළින් පාලකයා පිළිබඳව ජනතාව බලාපොරොත්තු වූයේ,

1. ආක්‍රමණකාරී බව. 2. පරාර්ථකාමී වීම හා ඍජු බව.
3. දැඩි තීරණ ගැනීම හා මෘදු බව. 4. ආදර්ශවත් වීම හා ධාර්මික වීම.

13. මධ්‍යගත පාලනයක් ගොඩ නැගීම සඳහා අංග සම්පූර්ණ අගනුවරක් නිර්මාණය කළේ,

1. පණ්ඩුකාභය. 2. විජය. 3. දුටුගැමුණු. 4. දේවානම් පියතිස්ස.

පහත වගුවේ A-H දක්වා ඇති තොරතුරු ඇසුරින් 14-15 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රාජධානිය | සබඳතාව | සබඳතා පැවැත් වූ රට |
|---|---|---|
| A අනුරාධපුර | C පත්තිනි දේවාලයක් විවෘත කිරීමේ උත්සවයට යාම. | F රෝමය |
| B පොළොන්නරුව. | D රුවන්වැලි සෑය අලංකාර කිරීමට වීදුරු පබළු ගෙන ඒම | G චේර |
| | E වේලයික්කාර හමුදාව දළදා වහන්සේ ආරක්ෂා කිරීම. | H දකුණු ඉන්දියාව |

14. භාතිකාභය රජු හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. ADH 2. ADF 3. BDH 4. BDF

15. පළමු වන විජයබාහු රජු හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. AEF 2. BCG 3. BEH 4. BCH

16. රතු කැට දිවයින නමින් ලංකාව හඳුන්වා ඇත්තේ කුමන ජාතිකයන් විසින් ද?

1. රෝම. 2. ග්‍රීක. 3. අරාබි. 4. පෘතුගීසි.

17. නානා දේසි වෙළඳ සංවිධානයට අයත් ලෝහ මුද්‍රාවක් හමු වී ඇත්තේ කුමන ප්‍රදේශයෙන් ද?

1. බෝවත්තේගල. 2. සීගිරි ජල උද්‍යානය. 3. මහියංගනය. 4. හම්බන්තොට.

18. පහත I තීරුවේ දැක්වෙන ස්ථාන හෝ ආයතන අතීතයේ භාවිත කළ නාමයන් II තීරුවෙන් තෝරා අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. ගැබිණි මව්වරුන්ගේ මාතෘ නිවාස. | A - එක්තැන් සමිය. |
| 2. සෞඛ්‍ය පහසුකම් සහිත රෝහල්. | B - වෙජ්ජ ශාලා. |
| 3. රාජාණ්ඩු ක්‍රමය යටතේ සැකසුණු රාජසභාව. | C - උපසග්ගරෝගනාස. |
| 4. උණ රෝගීන් සඳහා ඉදිකළ විශේෂ රෝහල. | D - පසවන්ති නාමශාලා. |

1. DBAC 2. BACD 3. DCAB 4. BADC

19. "කැති අඩ" , "කෙටුකනබ" යනුවෙන් සෙල්ලිපි වල හඳුන්වා දී ඇත්තේ,

1. හේන් වගාව වෙනුවෙන් අය කළ බදු වර්ග දෙකකි. 2. හේන් වල වගා කළ කන්න දෙකකි.
3. හේන්වල ආරක්ෂාව සඳහා යොදා ගන්නා උපකරණ දෙකකි. 4. හේන් වල වගා කළ බෝග වර්ග දෙකකි.

20. පුරාණ කාලයේ ලෝහ භාවිත කරමින් කර්මාන්ත වල යෙදුණු ශිල්පීන් විවිධ නම් වලින් හඳුන්වා ඇත. එකල විසූ රන් කරුවන් හැඳින් වීමට භාවිත කළ නාමය වන්නේ,

1. කබර. 2. තඹකර. 3. තුලාදර. 4. මණිකර.

21. දකුණු ඉන්දීය කුලී හේවායින් සහය පැතූ පැරණිතම ශ්‍රී ලාංකීක පාලකයන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. ඉලනාග - දුටු ගැමුණු. 2. ඉලනාග-අභයනාග 3. ඉලනාග-මහසෙන් 4. අභයනාග-වළගම්බා..

22. ක්‍රි.ව. 850 දී පමණ ශ්‍රී පාදය වන්දනාමාන කිරීමට පැමිණි දේශ ගවේශකයෙකු මෙන්ම වෙළෙන්දෙකු වූ තැනැත්තා,
1. සුලෙයිමාන්. 2. බැලදියස්. 3. ඉබන් බතූතා. 4. වෙං හෝ.

23. අතීත ශ්‍රී ලංකාවේ වගා කන්න තුනක් පැවති බවට සාධක හමු වේ. තුන්වන කන්නය වගා කිරීම තීරණය වූයේ,
1. ගම් නායකයාගේ අභිමතය පරිදි ය. 2. පසුගිය කන්නයේ ලැබූ අස්වැන්න මතය.
3. ජලය ලබා ගැනීමේ හැකියාව පරිදි ය. 4. ගොවීන්ගේ උන්නදුව මතය.

24. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගල් බැම්මකට අයත් කොටස් හමු වී ඇති ස්ථානය කුමක් ද?
1. පාහියංගල ලෙන. 2. රංචාමඩම. 3. අලිගල. 4. කිතුල්ගල බෙලි ලෙන.

25. කෘත්‍රිමව සාදන ලද කඳු ගැට වලට වැව් බැම්ම සම්බන්ධ කිරීම,
වැව් බැම්මේ දිග සැතපුම් 7 ක් පමණ වීම,
අර්ධ ශුෂ්ක කලාපයේ පිහිටා තිබීම,
ඉහත තොරතුරු ගැළපෙනුයේ පහත කුමන වාරිකර්මාන්තයට ද?
1. කලා වැව. 2. මින්නේරිය වැව. 3. යෝධ වැව. 4. පදවිය වැව.

26. සීගිරියේ ජල මල් සඳහා යොදා ඇති ගල් පතුරේ සිදුරු වල විෂ්කම්භය තුළින් සිදු කර ඇත්තේ,
1. පීඩනය තුළින් එසවෙන ජල පහරේ උස වෙනස් කිරීම. 2. වේගවත් ජල පහරක් ලබා ගැනීම.
3. ගලා එන ජලයේ පීඩනය අඩු කිරීමට. 4. ගලා එන ජලයේ පීඩනය වැඩි කිරීමට.

27. විශාල බරක් දැරිය හැකි වන සේ ඉදි කළ වාස්තු විද්‍යාත්මක නිර්මාණ වලදී නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමයක් අනුගමනය කළ බවට අනුගමනය කළ බවට සාධක ලැබෙන්නේ,
1. මල්වතු ඔය ගල් පාලම. 2. රුවන්වැලි සෑය අත්තිවාරම.
3. මාදුරු ඔය සොරොව්ව. 4. සීගිරිය මහ වැව් බැම්ම.

28. ආලාහන පිරිවෙන් සංකීර්ණයේ සොයා ගැනීම් පිළිබඳ වැදගත්ම තොරතුරු සඳහන් පිළිතුර තෝරන්න.
1. ලෝහ තාක්ෂණයේ දියුණුව හා ජල කළමණාකරණයේ දක්ෂතාව.
2. ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ දියුණුව හා උද්‍යාන නිර්මාණ කුසලතාව.
3. ශල්‍ය වෛද්‍ය විද්‍යාවේ දියුණුව හා අපද්‍රව්‍ය කළමණාකරණයේ දක්ෂතාව.
4. අපද්‍රව්‍ය කළමණාකරණයේ දක්ෂතාවය හා වාස්තු විද්‍යාත්මක කුසලතාව.

29. මෙරට පැරණි රන් කර්මාන්තයේ දියුණුව විදහා පාන මල් කැටයම් 21 සහිත වී ඇටයක ප්‍රමාණයේ රන් තැල්ලක කොටසක් හමු වූ ස්ථානය,
1. අභයගිරි විහාරය. 2. සීගිරිය. 3. ජේතවන විහාරය. 4. මිහින්තලය.

30. පොළොන්නරු යුගයේ "ගාවුත කණු" භාවිත කර ඇත්තේ,
1. රාජ්‍ය අයිතිය දැක්වීමට ය. 2. මහා මාර්ග වල දුර දැක්වීමට.
3. ඇල මාර්ග වල දුර දැක්වීමට ය. 4. අභය භූමි වල සීමා දැක්වීමට ය.

31. අතීත සමාජයේ යම් අපරාධකරුවකු ගමක සැඟ වී සිටින අවස්ථාවක ඔහු අල්ලා දීමේ වගකීම පැවරී තිබුණේ,
1. ගමිකට ය. 2. දසගම් ඇත්තන්ට ය. 3. පරුමකට ය. 4. ගමේ සියලු දෙනාට ය.

32. අතීත ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළදාම පිළිබඳ නීති ඇතුළත් ශිලා ලේඛනයක් වන්නේ,
1. වේවැල්කැටිය. 2. මිහින්තලා පුවරු ලිපිය.
3. සොරබොර වැව ටැම් ලිපිය. 4. ගොඩවාය ලිපිය.

33. තෙවරක් ම මෙරට පාලනය කල රැජින ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ,
1. ලීලාවතී. 2. සුගලා. 3. චූල සීවලී. 4. කල්‍යාණවතී.

34. පැරණි ශ්‍රී ලංකාවේ කාන්තාව විශේෂ ගෞරවාදරයට පත් වීමට බල පෑ ප්‍රබලම සාධකය වූයේ,
1. මව්වරුන් ලෙස වගකීම් උසුලමින් කටයුතු කිරීම. 2. කුල සිරිත් ආරක්ෂා කරමින් ජීවත් වීම.
3. ස්වාමි භාර්යා ගෞරවය සුරකිමින් ජීවත් වීම. 4. සූපශාස්ත්‍ර පිළිබඳ දක්ෂතා දැක්වීම.

35. පහත ප්‍රකාශය සලකන්න.
- නගර නිර්මාණය ජ්‍යාමිතික ආකෘතියෙන් මිදී නිදහස් ස්වරූපයක් ගැනීම.
- නගර මහා පරිමාණ ස්වරූපයක් පෙන්නුම් නොකිරීම.

ඉහත ප්‍රකාශ හා සම්බන්ධ නගර යුගලය වන්නේ,

1. අනුරාධපුරය - පොළොන්නරුව.
2. දඹදෙණිය - යාපහුව.
3. අනුරාධපුරය - දඹදෙණිය.
4. පොළොන්නරුව - කුරුණෑගල.

36. පහත දී ඇති ප්‍රකාශ අතරින් පොළොන්නරු යුගය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
1. බුදු දහමත් සංස්කෘතියත් කෙරෙහි හින්දු බලපෑම දැකිය හැකි ය.
2. මාඝ ආක්‍රමණය නිසා පොළොන්නරු රාජධානිය බිඳ වැටුණි.
3. මහා තිත්ථ වරාය පොළොන්නරු යුගයේ ප්‍රධාන වරායක් වශයෙන් පැවතුණි.
4. ප්‍රථම වරට පාලන මධ්‍යස්ථානය ලෙස චෝලයන් පොළොන්නරුව තෝරා ගනී.

- පහත A,B,C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර 37, 38, 39 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - 1. පොළොන්නරුව බිඳ වැටීම.
2. කාලිංග මාඝ ආක්‍රමණය.

B - 1. දඹදෙණි රාජධානිය.
2. 5 වන මිහිඳු.

C - 1. මුල්ම රාජධානිය.
2. අනුරාධපුරය.

D - 1. චෝලයන්ගෙන් රට මුදා ගැනීම.
2. පළමු වන විජයබාහුගේ රාජ්‍යත්වය තහවුරු වීම.

37. පළමු වැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවක් නොදක්වන යුගලය,
1. A 2. B 3. C 4. D

38. පළමු වැන්න ඇති වීමට දෙවැන්න හේතුවක් වූ බව දැක්වෙන යුගලය,
1. A 2. B 3. C 4. D

39. දෙවැන්න බිහි වූයේ පළමු වැන්නේ ප්‍රතිඵලයක් ලෙස බව දැක්වෙන යුගලය,
1. A 2. B 3. C 4. D

40. යාපනය රාජධානියේ ආරම්භක පාලකයා කවුද?
1. වරෝදය. 2. පරරාජසේකරම්. 3. විජයකුලංකෛ. 4. සංකිලි.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 33 S II |
|---|---|---|

නම: ..............................................  **ඉතිහාසය II**  කාලය : පැය තුනයි

- අමතර කියවීම් කාලය මිනිත්තු 10.

උපදෙස්,

- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. (අ) I. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
කලා ඔය, කිරිදි ඔය, දඹකොල පටුන, ලංකා පටුන, මින්නේරිය වැව, නාච්චදූව වැව, යාපනය, දේවනගර, තිරුකේතිශ්වරම්, හෝර්ටන්තැන්න, සෙංකඩගල, කුරුණෑගල.

II. පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
රෝමය, රතු මුහුද, පෘතුගාලය, කැලිකට්, තායිලන්තය, බතාවිය.

(ආ) I. පහත A,B,C,D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - නාගදීපය පාලනය කළ සෘෂිගිරි ඇමතිවරයා විසින් ඉදි කළ විහාරය.
B - රජුට අයත් ඉඩම් වල වගා කිරීම වෙනුවෙන් අය කළ බද්ද.
C - යෝගාර්ණවය නම් වටිනා වෙද පොත රචනා වූ යුගය.
D - ඇම්බැක්කේ දේවාලය කර වූ රජු.

A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනු පිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

II.



A රූපය

1. A පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?
2. මෙය පිහිටා ඇති ස්ථානය ලියන්න.
3. මෙයින් නිරූපණය වෙතැයි සැලකෙන්නේ කුමක් ද?
4. මෙම නිර්මාණය අභාෂය ලබා ඇති කලා සම්ප්‍රදාය කුමක් ද?

III. 1. B පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය පිහිටා ඇත්තේ කිනම් නගරයක ද?
3. එය ඉදි කළ රජතුමා කවුද?
4. මෙහි තැන්පත් කර ඇති පූජ්‍ය වස්තුව කුමක් ද?



B රූපය

## II කොටස

02. I. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගත හැකි පුරා විද්‍යාත්මක මූලාශ්‍ර වර්ග තුනක් නම් කරන්න.

II. ඉතිහාසය ගොඩ නැගීමට සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් නම් කරන්න.

III. ඉතිහාසය හැදෑරීමේ දී කාසි වැදගත් වන ආකාරය කරුණු 2 ක් ඇසුරින් විස්තර කරන්න.

IV. ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු 3 ක් ඇසුරින් විස්තර කරන්න.

03. I. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගල් යුගයේ මානවයා ජීවත් වූ,
A - තෙක් කලාපීය ලෙන් වාසස්ථාන 2 ක් ද,
B - තෙක් කලාපීය එළිමහන් වාසස්ථාන 1 ක් ද නම් කරන්න.
II. ප්ලයිස්ටෝසීන යුගයට අයත් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳ පැරණිම සාධක හමු වන ප්‍රදේශ 2 නම් කරන්න.
III. පූර්ව ඓතිහාසික යුගයේ දියුණු තාක්ෂණයක් පැවති බවට කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න.
IV. මුල් ඓතිහාසික ජනවාසවල ව්‍යුහය හා ස්වරූපය කරුණු 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

04. I. අතීත ශ්‍රී ලංකාවේ රජවරු භාවිත කළ රාජ්‍යත්ව සංකල්ප කිහිපයක් පහත දැක්වේ. ඒවා භාවිත කළ රජවරු කවුරුන් දැයි අනුපිළිවෙලින් ලියන්න.
A - නරේශ්වර. B - දේවත්ව. C - පර්වතරාජ
II. අතීත පාලකයන් තමන්ගේ රටවැසියාට ඉටු විය යුතු යැයි අපේක්ෂා කළ යුතුකම් 2 ක් ලියන්න.
III. පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාරය උදාහරණ 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න.
IV. පළමු වන විජයබාහු රජතුමා රටේ සමස්ත භූමියේ පැවැත්ම ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග 2 ක් විස්තර කරන්න.

05. I. හේත් හැඳින් වීමට පහත සඳහන් වචන භාවිත කර ඇති මූලාශ්‍ර A,B,C අනුපිළිවෙළින් ලියන්න.
A - සෙහෙන් B - සේන් C - පිටිබිම්
II. සොරබොර වැව ටැම් ලිපියේ වෙළඳපලක පාලනය පිළිබඳ ඇතුළත් නීති රීති 2 ක් ලියා දක්වන්න.
III. පැරණි ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ කර්මාන්ත දියුණුව පැවති බව උදාහරණ 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න.
IV. මෙරට පාලනය කළ රජවරු අසල්වැසි රටවල් සමඟ මෙන්ම දුරු රටවල් සමඟ සබඳතා පැවැත් වූ ආකාරය කරුණු 3 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

06. I. A,B,C අනුපිළිවෙළින් නම් කරන්න.
A - වැවෙන් ජලය පිටතට ගලා එම ට ගලින් තැනූ ආයත චතුරස්‍රාකාර අවකාශය.
B - ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා කිරීමට වියළි කලාපයේ ජනයා අනුගමනය කළ ක්‍රමවේදය හඳුන්වන නම.
C - බෝධිය ආවරණයට තැනූ ගෙය.
II. A - අඹන් ගඟ හරස්කොට තැනූ ඇල මාර්ගය.
B - එමගින් ජලය ගෙන ගිය වැව් 3 ක් නම් කරන්න.
III. අතීත ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ටත්වය බෞද්ධ ගොඩනැගිලි ඇසුරින් පෙන්වා දෙන්න.
IV. අතීත රජවරු ජනතාවගේ සනීපාරක්ෂාව හා ස්වස්ථතාව නගා සිටු වීමට කටයුතු කළ ආකාරය උදාහරණ 3 ක් ඇසුරින් පෙන්වා දෙන්න.

07. I. පැරන්නන් අවකාශය මැනීම සඳහා භාවිත කළ මිම් වර්ග 3 ක් නම් කරන්න.
II. පැරණි කාලයේ යකඩ නිස්සාරණය සඳහා අනුගමනය කළ ක්‍රමවේද 2 ක් නම් කරන්න.
III. සීගිරිය ජලමල් උද්‍යානයේ නිර්මාණශීලිත්වය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
IV. අතීත ශ්‍රී ලංකාවේ පැවති කෘෂිකර්මාන්තය හා සම්බන්ධ කෙම්පහන් ක්‍රම හා යාගහෝම ඇසුරින් පැරණි සමාජයේ පැවති චත් සිරිත් චාරිත්‍ර පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

08. I. පැරණි සමාජයේ නිෂ්පාදන භුක්ති විඳිමින් ප්‍රභූන් ලෙස කටයුතු කළ කණ්ඩායම් 3 ක් නම් කරන්න.
II. පහත සඳහන් තොරතුරු ඇතුළත් මූලාශ්‍රය කුමක් දැයි වරහන් තුළින් තෝරා ලියන්න.
A - මහාධිකරණයක් ගැන සඳහන් සෙල් ලිපිය.
B - පරුමකලු සමනා නම් කාන්තාවක් ගැන සඳහන් සෙල්ලිපිය.
C - තිල සංගුලිකා නම් ආහාරයක් ගැන සඳහන් මූලාශ්‍රය.
D - මී හරකුන් එළහරකුන් ඝාතනය කරන්නන්ට මරණ දඩුවම ලබා දිය යුතු බව සඳහන් මූලාශ්‍රය.
(වේවැල් කැටිය සෙල් ලිපිය, බ්‍රාහ්මණයාගම සෙල් ලිපිය, සද්ධර්මාලංකාරය, සිතුල්පව්ව සෙල්ලිපිය, තෝනිගල සෙල්ලිපිය, දඹියා අටුවා ගැටපදය, මිහින්තලා පුවරු ලිපිය.)
III. අතීත පාලකයන් පරිසරය ආරක්ෂා කිරීම සඳහා ගත් ක්‍රියා මාර්ග උදාහරණ 2 ක් ඇසුරින් විස්තර කරන්න.
IV. 'අතීත කාන්තාව සමාජයේ ගරු බුහුමන් ලැබූ අයෙකි' මේ කියමන උදාහරණ 3 ක් ඇසුරින් පහදන්න.

09. I. කාලිංග මාඝ ගේ ආක්‍රමණයත් සමඟ ස්වදේශික නායකයන් ආරක්ෂිත ස්ථාන වල පිහිටුවා ගත් ස්වාධීන පාලන මධ්‍යස්ථාන 3 ක් ලියන්න.
II. පැරණි නගර පරිහානියට පත් වීමට බල පෑ හේතු 2 ක් ලියන්න.
III. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසු ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් 2 ක් උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.
IV. හයවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන හා සාහිත්‍ය සේවා උදාහරණ 3 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank